# ආතරයිටිස්
## (හන්දි ප්‍රදාහය)
## Athritis





**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

ආතරයිටිස් යනු හන්දි, මාංශපේෂි අස්ථි වල ඇතිවන රෝගී තත්වයන් හැඳින්වීමට පොදුවේ භාවිතා කරන වචනයකි. විවිධ ආතරයිටිස් වර්ග හා සම්බන්ධ රෝග 150 කට වඩා පවතී.

වඩා සුලභ ආතරයිටිස් වර්ග වනුයේ Osteoarthritis, Rhewumatoid, Athritis හා Gout යන ප්‍රභේදයි.

ආතරයිටිස් ඕනෑම වයස් කාණ්ඩයක කෙනෙකුට වැළඳිය හැකි රෝගී තත්වයකි. කුඩා ළමුන් මැදි වයසේ උදවිය මෙන්ම මහලු වයසේ උදවියටද විවිධ ප්‍රභේද වල ආතරයිටිස් වැළඳිය හැක.

### ආතරයිටිස් වල ප්‍රභේද මොනවාද?

රෝගයට පදනම් වන හේතු කාරක අනුව ප්‍රධාන ප්‍රභේද 03කට බෙදිය හැකිය.

01 Imflammatory - මෙහිදී ප්‍රධාන ලක්ෂණය වන්නේ හන්දි වල ඇතිවන ඉදිමීමයි.
උදා:- Rhewmatoiat thritis, lupus, Posratic Arthritis

02 Degenerative - මෙහිදී හන්දි ගෙවී යෑමෙන් රෝග ලක්ෂණ හට ගනී.
උදා:- Osteoarthritis

03 Other Types - ඉහත කාණ්ඩ දෙකටම ඇතුල් නොවන වෙනත් අස්ථි පටක ආදිය ආශ්‍රිත රෝගාබාධ මීට ඇතුළත් වේ.
උදා:- Fibromyalsia

### ආතරයිටිස් වල රෝග ලක්ෂණ මෙනවාද?

වේදනාව
හන්දි ඉදිමීම
හන්දි රතු පැහැවීම හා උණුසුම් ගතිය
මාංපේශී වේදනාව
හන්දි වල තද ගතිය(ස්ටිෆ්නස්)
හන්දි වල චලනය අඩු වීම




මහන්සි ගතිය වැනි අනෙකුත් රෝග ලක්ෂණ

### ආතරයිටිස් රෝග නිර්නය කරගන්නේ කෙසේද? (Diagnosis)

ඔබගේ හන්දි වල වේදනාවක් ඉදිමීමක් ඇතිනම් පවුල් වෛද්‍යවරයා හමු වී රෝගය නිර්ණය කරගැනීම වැදගත්ය. මක් නිසාද යත් ඉක්මනින් ප්‍රතිකාර ආරම්භ කල විට රෝගය පාලනය කරගැනීම පහසු නිසාය.

ආතරයිටිස් වර්ග ගණනාවක් ඇති නිසා ඔබගේ වෛද්‍යවරයා විසින් රෝගය නිර්ණය කර ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිතා කරනු ඇත.

01. Medical History - රෝග ඉතිහාසය ගැන ප්‍රශ්න කිරීම මගින් රෝගියා විස්තර කරන රෝග ලක්ෂණ හා ඉතිහාසය පදනම් කරගෙන යම් යම් ආතරයිටිස් වර්ග ඇති බව නිගමනය කල හැකිය.

උදාහරණයක් වශයෙන් යම් රෝගයෙකුගේ ඇඟිලි වල හන්දි ඉදිමීම හා උදෑසන අවදිවන විට තද ගතියක් Stiffness ඇතිනම් බොහෝ විට Rheumatic Arthritis ඇති බව අනුමාන කල හැකිය.

2. Physical Examination - වෛද්‍යවරයා විසින් අදාළ හන්දි වල ඉදිමීම තද ගතිය චලනය ආදිය පරීක්ෂා කර රෝගය නිර්ණය කරගැනීම මෙමගින් සිදුවේ.

3. විකිරණ පරීක්ෂණය - X ray, Ultrasound Scan, CT Scan, MRF Scan වැනි විකිරණ පරක්ෂණ මගින් හන්දි හා අස්ථි ආදියේ අභ්‍යන්තර විස්තර දැන ගැනීම මගින්

4. රුධිර පරීක්ෂාවන් - සමහර ආතරයිටිස් වර්ග වලදී ශරීරයේ වෙනත් ආවයව වලටද හානි පැමිණිය හැකිය. එසේම රුධිරයේ විවිධ සංඝටක වල ඇතිවන වෙනස්කම් මගින් සමහර රෝග නිර්නය කරගත හැකිය.

5. Exercise Physiologist - ව්‍යායාම කිරීම මගින් ශරීරයේ බර අඩුකරගෙන හන්දි වලට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා උපදෙස් සපයනු ලැබේ.

6. Occupational Thrapist - රෝගය වැළඳුනු අයකුගේ දෛනික වැඩකටයුතු, රිය පැදවීම්, වැඩ කරන ස්ථානයේ සුදුසු වැඩ නිර්දේශ කිරීම වැනි දේ සඳහා උපාකාරි වන අයෙකි.

7. Podiatrist - පාදවල හන්දි වල ඇතිවන රෝගී තත්ව ගැන උපදෙස් සැපයීම සිදු කෙරේ.

8. Rheumatologist - හන්දි ආශ්‍රිත රෝගාබාධ පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකි.

### ආතරයිටිස් සඳහා භාවිතා කරන ඖෂධ වර්ග මොනවාද?

1. වේදනා නාශක (Anagesics) උදා - පැරසිටමෝල්
2. Anti infrommalory medication උදා - නියුරෝෆන්
3. Creams Ointment - වේදනාව හා ඉදිමීම සඳහා තාවකාලි සහනයක් ලබා දෙයි
4. Corticosterrios - වේදනාව හා ඉදිමීම පාලනය කරන වඩා සැර ඖෂධ කාණ්ඩයකි.

එක් එක් ආතරයිටිස් වර්ගය පිළිබඳව සවිස්තරාත්මකව සලකා බැලීම ඉදිරි ලිපියක් මගින් සිදු කරමු. විශේෂයෙන් ප්‍රධාන ප්‍රභේද දෙක වන Osteoarthritis හා Rhewmatoiat thritis ගැන වැඩිදුර ලිපියක් ඉදිරියේදී බලාපොරොත්තු වන්න.

**රියැදුරන් අවශ්‍යයි**
UBER වාහන පැදවීම සඳහා පළපුරුදු රියැදුරන් අවශ්‍යයි
නිකැළැල් රියැදුරු ඉතිහාසයක් ඇති අය විමසන්න
ටැක්සි බලපත්‍රය තිබීම අමතර සුදුසුකමකි

**විමසන්න**
**0422 671 826**